# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම අංක 06 -2020
## බුද්ධ ධර්මය

Name / Index No :........................................................ **Grade 3**

**2020.06.13 සිට 2020.06.19 සතිය දක්වා කරවන්න.**

❖ දෙමාපියන් සඳහා උපදෙස්,

- **හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා බුද්ධ ධර්මය පොතේ අලවන්න.**
- හැකි ලෙස දරුවාට පාඩමේ කොටස් පැහැදිලි කර දෙන්න.
- පිළිතුරු පමණක් දරුවාට ලියන්න දෙන්න.
- පාඩමට අදාළ Whatsapp මගින් Video Clips, Audio Clips එවා ඇත්නම් පෙන්වා දී පැහැදිලි කර දෙන්න

# 13 පොත් පෙරහැර

❖ පාඩම ශබ්ද නගා තියවන්න.




- **පාඩමට අදාළ Whatsapp මගින් එවා ඇති Audio Clip එකට සවන්දෙන්න**

අපි දෙවන ශ්‍රේණියේ දී පෙරහැරක් පැවැත්වූවා දුවලා පුතාලට මතක ද?

මම එදා පෙරහැරේ කොඩියක් අරන් ගියා.

මම තමයි බෙර ගැහුවේ.
මම මල් ගස අරන් ගියා.
මම තමයි කස කාරයා.

අපි මල් අරන් ගියා.

## පොත් පෙරහැර.

පෙරහැරේ අපි අරන් යන්නේ පොත්. පෙරහැරේ මුලින් ම "පුංචි අපේ පොත් පෙරහැර" කියලා ලියපු පුවරුව. ඊට පස්සේ හේවිසි කණ්ඩායම. ඊට පස්සෙ පොත් පෙරහැර. පොත් ගෙනියන්න ඕන හිස මත තියාගෙනයි. කවුරුත් හිස මතට පිරිසිදු සුදු ලේන්සුවක් දාගන්නව නම් බොහොම හොඳයි. ඊට පස්සෙ පේළියට ගමන් කරන්න ඕන.

## පුහුණුවට

පාසල් ඇඳුමින් සැරසුණු දරුවන්
දෑතින් පොත් ගෙන පෙරහැර යනවා
ගුරු මවු පියවරු දරුවන් සමගින්
හද පිරි සතුටින් පෙරහැර යනවා

දෙපස සිටින දෙගුරුන් සැම දෙනගේ
පෙරහැර දසුනින් සිත් පැහැදෙනවා
පෙරහැර බලමින් සතුටින් සැමදෙන
පුංචි ළමුන් හට අසිරි පතනවා

පෙරහැර යනවා
පොත් දන් දෙනවා
පින් රැස් වෙනවා
නුවණ වැඩෙනවා

❖ ' පෙරහැර ' යනු කුමක් දැයි සරල ව දරුවාට පැහැදිලි කරන්න. ඒ සඳහා පහත කරුණු ද එක් කර ගන්න.

- දළදා පෙරහැර
- පොසොන් පෙරහැර / මිහඳු පෙරහැර
- මල් පෙරහැර ආදි වශයෙන් පෙරහැර පවත්වන බව

❖ පොත් හිස මත තබාගෙන පේළියට ගමන් කිරීම පොත් පෙරහැර වශයෙන් හඳුන්වන බව

❖ ඒවා පුස්තකාලයක තැන්පත් කරන බව

❖ එම පොත් අන් අයට ද පරිහරණය කිරීමට අවස්ථාව ලැබෙන බැවින් එය පින් සිදු වන කටයුත්තක් බව පැහැදිලි කරන්න.

Richmond College 2020

➢ පිළිතුරු ලියන්න.

1) ඔබ දන්නා වෙනත් පෙරහැරවල නම් ලියන්න.

- ……………………………………………………………………………
- ……………………………………………………………………………
- ……………………………………………………………………………
- ……………………………………………………………………………

2) පොත් පෙරහැරක් යන පිළිවෙළ ලියන්න.

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

3) පොත් පෙරහැරක් යන්නේ කුමන ස්ථානවලටද?

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

4) පොත් පෙරහැරක් අඳින්න.

❖ හැකි ලෙස පහත ක්‍රියාකාරකම් කරන්න.

- සාමූහිකව එකතු වී ඖෂධ පැළයක් රෝපණය කරන්න.
- ශ්‍රමදානයකට සහභාගි වෙමින් පරිසරය පිරිසිදු කරන්න.

Richmond College - Grade 3 – 2020